සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

ශ්‍රේණිය: 10 | විෂය : නර්තනය | සතිය: සැප්තැම්බර් 01

**1.**නිපුණතාවය : නර්තනය හා බැඳි මූලධර්ම අනුගමය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම: නර්තන කලාව හා සැබැඳි ප්‍රකාශන විධි ක්‍රම අධ්‍යනය කරමින් අදහස් දක්වයි.

විෂය සන්ධාරය (පාඩම) **: සතර අභිනය**

## 2.ඉගෙනුම් පල

- ❖ අභිනය යන්න නිර්වචනය කරයි.
- ❖ සතර අභිනය නම් කරයි.
- ❖ ප්‍රේක්ෂක රසවින්දනය සඳහා සතර අභිනය ප්‍රබල මාධ්‍යක් වන බව පිළිගනී.
- ❖ සතර අභිනය භාවිතා වන අවස්ථා හඳුනා ගනී.
- ❖ සතර අභිනයට අයත් අංග වෙන්කර දක්වයි.
- ❖ සාමූහිකව අදහස් දක්වමින් නර්තනයට උචිත සිද්ධියක් ගොඩනගයි.
- ❖ ඒකලව හා සාමූහිකව සතර අභිනය ප්‍රකාශිත නර්තන අංගයක් නිර්මානය කර ඉදිරිපත් කරයි

## 3.සිසුවා කළ යුතු කාර්යයන්

- දුවේ..පුතේ..පහත දී ඇති උපදෙස් අනුව කටයුතු කරන්න .
- දී ඇති ක්‍රියාකාරකම වෙත ඔබේ අවධානය යොමු කර අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

**<u>ක්‍රියාකාරකම</u>**

**1) A හා B රූප වලින් නිරූපිත නර්තන අංගයන් හඳුනා ගත්තෙහිද...**

A



B



i. මෙම නර්තන අංග ඔබ හඳුනා ගත්තේ කෙසේද?
ii. එබඳු අදහස් ප්‍රකාශ කිරීම සඳහා යොදා ගත හැකි වෙනත් ක්‍රම තිබේද ,ඒ මොනවාද?
iii. එම ප්‍රකාශන විධි නර්තන නිර්මාණයකදී යොදා ගැනීමෙන් ඇති වන ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න .
iv. මෙම නර්තන අංග දක්නට ලැබෙන අවස්ථා දෙක බැගින් සඳහන් කරන්න

**2).දුවේ.. පුතේ..ඔබ පාසලේදී උගත් වන්නම් නර්තනය,චරිත නිරූපනය වැනි අවස්ථාවන් මතකයට නගා ගන්න..එම අවස්ථා සඳහා සතර අභිනය යොදා ගත් අයුරු සඳහන් කරන්න.**

i) වන්නම් නර්තනයේදී ii) චරිත නිරූපනයේදී iii) ගැමි නැටුම් නිර්මාණයේදී

**3).ඔබ නිවසේ ගත කරන මෙම කාලය තුළදී සතර අභිනය පාඩමට අදාලව අන්තර්ජාලය,YouTube නාලිකා හා වෙනත් ඉගෙනුම් ආධාරක ඇසුරු කරගෙන තොරතුරු ලබා ගෙන පහත අභ්‍යාස කරන්න.**

i. අභිනය යන්න නිර්වචනය කරන්න.
ii. සතර අභිනය නම් කර ඒවා වෙන් වෙන්ව හඳුන්වන්න .
iii. සතර අභිනය නිරූපිත කෙටි සිද්ධියක් ගොඩ නගන්න.
iv. ඔබ මෙම පාඩමින් උගත් තොරතුරුද උපකාර කර ගෙන සතර අභිනයද යොදා ගනිමින් අවස්ථාවක් හෝ සිද්ධියක් හෝ නර්තනයක් නර්තන මාධ්‍ය යොදා ගනිමින් නිර්මාණය කර ඉදිරිපත් කරන්න.

( දුවේ..පුතේ.. මේ සඳහා පහත link ඔබට උපකාර කර ගන්නත් පුලුවන්.)

**4. ඉහත ක්‍රියාකාරකම සඳහා උපකාර කරගත හැකි පොත්පත්,Web site, LMS පාඩම් හා ඉගෙනුම් ආධාරක.**

- **e -තක්සලාව** - නැත
- **e-නැණ පියස - 10 ශ්‍රේණිය නර්තනය -** https://enenapiyasa.lk/
- **ගුරු ගෙදර** - නැත
- **වෙනත්-** You Tube
    - (Rosary Art) https://youtu.be/ZXh9Yn0v1iI
    - (Esanin TV) https://www.youtube.com/watch?v=w_IpD2hufnY&t=15s
- **අතිරේක කියවීම්පොත / සගරා**
    - 10 ශ්‍රේණිය නර්තනය අතිරේක කියවීම් පොත ( සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව)
    - 10 ශ්‍රේණිය නර්තනය කතෘ - ඥානසිරි පීරිස්

**ඔබගේ දනුම පිරික්සීම සඳහා මෙම ක්‍රියාකාරකමෙහි යෙදෙන්න .**

https://wordwall.net/play/19147/724/388

සැකසුම - නම - පී.එච්.අයි.පී. කුමාරි තනතුර - ශ්‍රී.ලං.ගු.සේ 2-1

අධ්‍යාපන ආයතනය - කෑ/දෙහි/දේදුගල ම.වි

දෙහිඕවිට අධ්‍යාපන කලාපය